# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
2171635
Po.Box No } 10120

ෆැක්ස්
தொலைநகல } 011-
Fax

දුරකථන
தொலைபேசி
Telephone } 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site } www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail } dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO } 1373 / 2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No } / 2024

දිනය
திக
Date } 24/08/2024 පැය 1440

## මාධ්‍ය නිවේදනය

### 01. අයිස් මත්ද්‍රව්‍ය සමග සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.

2024.08.23 වන දින සවස් කාලයේ මට්ටක්කුලිය පොලිස් වසමේ කදිරානවත්ත ප්‍රදේශයේදී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 13 මිලිග්‍රෑම් 820** ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 20 ක් වන මට්ටක්කුලිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

2024.08.23 වන දින රාත්‍රී කාලයේ ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ ඔරුගොඩවත්ත ප්‍රදේශයේදී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 12 මිලිග්‍රෑම් 100** ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 21 ක් වන වැල්ලම්පිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

### 02. මාරක රිය අනතුරක් - හිඟුරක්ගොඩ පොලිස් වසම.

2024.08.23 වන දින රාත්‍රී කාලයේ හිඟුරක්ගොඩ පොලිස් වසමේ හිඟුරක්ගොඩ සෝමාවතිය මාර්ගයේ කිලෝ මීටර් 02 කණුව ත් කිලෝ මීටර් 03 කණුවත් අතර ප්‍රදේශයේදී හිඟුරක්ගොඩ දෙස සිට සෝමාවතිය දෙසට ධාවනය වූ යතුරු පැදියක් පැදිකරුට පාලනය කර ගත නොහැකිව මාර්ගයෙන් ඉවතට පැන ඇලට වැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ යතුරු පැදියේ පැදිකරු හා පසුපැදිකරු හිඟුරක්ගොඩ රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී පැදිකරු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 29 ක් වන මැදිරිගිරිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය පොළොන්නරුව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර, තුවාලකරු වැඩිදුර ප්‍රතිකාර සඳහා පොළොන්නරුව රෝහල වෙත මාරු කර ඇත. හිඟුරක්ගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**